**පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල - 2022**

**-----------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය ව්‍යාවනය

පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට තත්ත්ව විස්තරය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.2 මතය ව්‍යාවනය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ව්‍යාවනය කල මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව;

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව;

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව;

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රමිත අංක 01 ප්‍රකාරව අරමුදල විසින් උපචිත පදනම මත ගිණුම් තැබිය යුතු වුවද , සමාලෝචිත වර්ෂයේදී පූර්ව වර්ෂවලට අදාලව හා සමාලෝචිත වර්ෂයට අදාලව ලැබී තිබූ දායක මුදල රු.91,670,745ක් මුදල් පදනමට ගිණුම් ගත කර තිබුණි. | පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ලබන ප්‍රතිලාභීන් සඳහා මාසික විශ්‍රාම වැටුප් ගෙවීම 2011 වර්ෂයේ සිටම ක්‍රමයෙන් ක්ෂය වන දැනට අක්‍රීය තත්ත්වයේ පවතින මෙම අරමුදල උපයෝගී කොට ගෙන සිදු නොකෙරෙන බැවින් විශ්‍රාම වැටුප් ගෙවීම උපචිත පදනම අනුව ගැලපීම සිදු කරනු නොලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව ආදායම් වියදම් උපචිත පදනම මත ගිණුම් ගත කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භාණ්ඩාගාර ප්‍රතිපාදන යොදා ගනිමින් 2022 වර්ෂයේ විශ්‍රාමිකයින් 39,478 ක් සඳහා රු.1,041,976,262 ක දායක මුදල් ගෙවීම් කර තිබුණු අතර මෙම ගෙවීම් ආදායම් වියදම් ගිණුමේ දක්වා නොතිබුණි. පළාත් පාලන ආයතන වලින් වර්ෂය තුළ දායක මුදල් ලැබීම් රු.91,670,744 ක් වූ අතර විශ්‍රාම වැටුප් අරමුදලින් ගෙවීම් ලෙස එම මුදල දායක මුදල් ලැබීමට එරෙහිව ආදායම් වියදම් ගිණුමේ ගිණුම් ගත කර තිබුණි. | සටහන 02, 03 හි අංක යටතේ ගිණුම් සටහනක් ලෙස ඉදිරිපත් කර ඇත. | ආදායම් වියදම් ගිණුමේ දායක මුදල් ලැබීම් හා ගෙවීම්වල ප්‍රතිඵලය දැක්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ සමස්ත ලැබීම් රු.91,670,744 ක ඇතුලත් ඉකුත් වර්ෂ සඳහා ලැබීම් රු.27,070,918 ක්, ඌණතාවය සමුච්චිත අරමුදලට මාරු කිරීම ලෙස ආදායම් වියදම් ගිණුමට ගලපා තිබුණි | ගිණුම් සංකල්පවලට අනුකූලව ආදායම් වියදම් ගිණුමේ අතිරික්තය හෝ ඌනතාවය සමුච්චිත අරමුදලට ගැලපීම සිදුකර ඇත. | දායක මුදල් ලැබීම් හා ගෙවීම් මත පදනම්ව ආදායම් වියදම් ගිණුමේ අතිරික්තය හෝ ඌනතාවය සමුච්චිත අරමුදලට ගැලපිය යුතුය. |

**1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම<br>රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම<br>රු. | වෙනස<br>රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| ලැබිය යුතු දායක මුදල | 994,388,194 | 141,701,021 | 852,687,173 | 2022 දෙසැම්බර් මස එවන ලද චෙක්පත් 2023 ජනවාරි මස අප වෙත ලැබීම හේතුවෙන් 2022 දෙසැම්බර් මස ගිණුම් ගත නොවීම මත මෙම වෙනස නිරූපනය වේ. | ශේෂ සනාථ කර ගැනීම තුළින් ලැබිය යුතු දායක මුදල තහවුරු කර ගැනීමට පියවර ගත යුතුය. |

**1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂය | මුදල<br>රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ලැබිය යුතු දායක මුදල් | 103,587,376 | ශේෂ තහවුරු කිරීම් | ඉදිරියේ දී මෙම පළාත් පාලන ආයතන වලින් ශේෂ තහවුරු වාර්තා ලබා ගෙන වෙනස්කම් ඇතොත් ඒවා නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ශේෂ සනාථ කර ගැනීම තුළින් ලැබිය යුතු දායක මුදල තහවුරු කර ගැනීමට පියවර ගත යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් පාලන ආයතනයක 2019 වර්ෂයේ අවසන් සාමාජිකයාද මිය ගොස් තිබියදී අයවිය යුතුව පවතින දායක මුදල් රු.435,355ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි | අදාල ආයතනය අඩු ආදායම් ලාභී ආයතනයක් වන බැවින් එම පළාත් පාලන ආයතනයෙන් අය විය යුතු රු.435,355ක හිඟ මුදල ගෙවීමට අපහසු බව 2023 මාර්තු 23 දිනැතිව ලිපියක් මඟින් අප වෙත දන්වා එවා ඇත. නමුත් ඉදිරියේ දී සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් එම මුදල අයකර ගැනීමට කටයුතු යොදා ඇත. | ලැබිය යුතු දායක මුදල් අයකර ගැනීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මූල්‍ය ප්‍රකාශන අනුව පළාත් පාලන ආයතන 303 කින් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු දායක මුදල් ශේෂය රු.1,090,156,001 ක් වූ අතර 2022 වර්ෂයේ දායක මුදල් ලැබී නොතිබුණු පළාත් පාලන ආයතන සංඛ්‍යාව 82 ක් හා එහි වටිනාකම රු.7,339,172 ක් විය . | පළාත් පාලන ආයතන වලට ලිපි මඟින් ද දුරකතන ඇමතුම් ලබා දීම මඟින් ද පළාත් පාලන ආයතන නිලධාරීන් සම්බන්ධ කරවා ගෙන ලැබිය යුතු දායක මුදල් ගෙන්වා ගැනීමට කටයුතු යොදා ඇති අතර එම හිඟ දායක මුදල් නිවැරදිව ප්‍රේෂණය කිරීම එම ආයතනයන්ගේ ද මූලික වගකීමක් වේ. | ලැබිය යුතු දායක මුදල් අයකර ගැනීමට පියවර ගත යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2016 ජූලි 29 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 07/2016 දරන චක්‍රලේඛය | 2016 අයවැය යෝජනා අංක 425 හා 426 මගින් පාර්ලිමේන්තුවේ පිළිගත් ක්‍රියාදාමයකට අනුකූලව සියලුම ව්‍යවස්ථාපිත හා ව්‍යවස්ථාපිත නොවන අරමුදල් පාර්ලිමේන්තු පාලනයට යටත් කිරීම සහතික කිරීම පිණිස මහා භාණ්ඩාගාරය විසින් 2016 ජුනි 11 දින විශේෂ කමිටුවක් පත් කර තිබූ අතර එම කමිටුව විසින් මෙම අරමුදලට අදාල පනත් සංශෝධනය කර වසා දැමිය යුතු බවට යෝජනා කර තිබුණද ඒ සම්බන්ධයෙන් තීරණයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද එම වාර්තාවේ හිඟ දායක මුදල් අදාල ආයතන වෙතින් ඉක්මනින් අය කර ගැනීමට කටයුතු කරන ලෙස දක්වා තිබූ නිර්දේශයද ක්‍රියාත්මක කර නොතිබුණි. | මහා භාණ්ඩාගාරය විසින් පත් කරනු ලැබූ විශේෂ කමිටුවේ 2017 මාර්තු 31 දිනෙන් නිකුත් කරන ලද කමිටු වාර්තාවට අනුව පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල ඇතුළු අරමුදල් පාර්ලිමේන්තු පනතක් මඟින් වසා දැමිය යුතු බවට නිර්දේශ කර ඇත. එසේ වුවත් එකී වාර්තාව සම්බන්ධයෙන් යම් ප්‍රතිපත්ති තීරණයක් ගෙන ක්‍රියාත්මක කිරීම සඳහා බලය ලබා දීමක් පිළිබඳව මෙතෙක් වාර්තා වී නැත. | අරමුදල වසා දැමීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතුය. |